## ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් භාණ්ඩාගාර ප්‍රකාශය සමඟ එකඟ විය යුතු නමුත් වැය විෂයයන් 23 ක භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශයට වඩා රු. 774,536,663 ක් අඩුවෙන්ද , වැය විෂයයන් 06 ක භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශයට වඩා රු. 2,375,954,824 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් භාණ්ඩාගාර ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වීම. | 2018 වර්ෂයේ භාණ්ඩාගාරයට වාර්තා කර තිබූ බැරකම් වාර්තාව සංශෝධනය කළ නොහැකි වූ බැවින් මෙම දෝෂය ඇති වී තිබුණි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)සමෘද්ධි බැංකු විසින් 2019 වර්ෂයේ ආපසු එවන ලද ඉතිරි සහනාධාර මුදල් වැය ලෙජරයට අධිභාර නොකර රු. 8,835,284 ක් රජයේ ආදායමටත් රු. 638,150 ක් පොදු තැන්පත් ගිණුමටත් මාරු කර තිබුණි. ආපසු ලැබුණු ඉතිරි සහනාධාර මුදලට අදාළව අරමුදල් දෙකකට හා අනිවාර්ය ඉතිරි කිරීම්වලට වැඩිපුර බැරකළ දායක මුදල් ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මාසික තත්‍ය සහනාධාර වියදම සඳහා අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කර භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වීම. | අධිභාර කරන ලද සහ ආදායමට බැරකරන ලද සහනාධාර මුදල් වටිනාකමට අදාළ අනිවාර්ය ඉතුරුම්, නිවාස ලොතරැයි සහ සමාජ ආරක්ෂණ දායක මුදලට අදාළ වටිනාකම් ගිණුම් ගැලපීමේ වැඩපිළිවෙලක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක වේ. |

| | | |
|---|---|---|
| (ආ)වෙනත් මූලධන වැය විෂයය යටතේ කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යල මගින් පිළිවෙලින් රු. 42,850 ක් හා රු. 4,200 ක් බැගින් වැයකළ එකතුව වන රු. 47,050 ක් අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මගින් දැරූ වියදම් වශයෙන් අග්‍රිම ගැලපුම් ගිණුමට ඇතුළත් කර තිබීමෙන් එම ගිණුමේ ශේෂය රු. 47,050 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි **208** යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මගින් දැරූ වියදම් නිවැරදිව අග්‍රිම ගැලපුම් ගිණුමට ගැලපීම් කළ යුතු වීම. | භාණ්ඩාගාරයට වාර්තා වූ වියදමක් ලෙස වැය ලෙජරයන්ට ඇතුළත් කිරීමෙන් සිදු වූ මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) වත්කම් සමීක්ෂණ කටයුතු 2019 අප්‍රේල් 17 දින වන විටද අවසන් කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 1,351,849,351 ක වත්කම් වටිනාකම භෞතිකව සනාථ වී නොතිබූ අතර, සිගාස් වැඩසටහන යටතේ භාණ්ඩාගාරයට වාර්තා කළ වත්කම්වල වටිනාකම රු. 675,257,516 ක් ද, භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව දෙපාර්තමේන්තුවේ වත්කම් වටිනාකම රු. 619,850 ක් ලෙස දක්වා තිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර ගිණුම්ගත මූල්‍ය නොවන වත්කම්වල නිවැරදිතාවය සනාථ කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සියළු වත්කම් නිවැරදිව ලේඛනගත කර ගිණුම්ගත කර භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වීම. | වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් නොකිරීම සම්බන්ධයෙන් අදහස් දක්වා නැත.<br>සිගාස් වෙබ් උත්පනය හරහා නියමිත පරිදි දත්ත උත්පනය නොවීමෙන් භාණ්ඩාගාර පොත්වල ඇති වූ වරද නිවැරදි කර භාණ්ඩාගාරයට මුළු වත්කම් වටිනාකම වාර්තා කර ඇත. |
| (ආ)ජීවනෝපාය සංවර්ධන වැය විෂයය යටතේ **2017** හා **2018** වර්ෂවලදී මිලදීගත් | -එම- | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය විධිවිධාන **2019** වර්ෂය තුළ |

| | |
|---|---|
| පිළිවෙලින් රු. **102,766,000** ක් හා රු. **6,140,126** ක් වූ ස්ථාවර වත්කම් භාණ්ඩාගාරයට වාර්තා කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සලසා ඇත. |

**1.6.4** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 අප්‍රේල් හා නොවැම්බර් මාසයන්හි ගිණුම් සාරාංශ අනුව අත්තිකාරම් ගෙවීම් රු. 219,920,079 ක් වුවද, එය රු. 204,745,258 ක් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලායාම වශයෙන් පෙන්වා ඇති රු. 1,986,925,054 ක වටිනාකමෙහි නිවැරදිතාවය සනාථ නොවුණි. | නිවැරදි සංඛ්‍යා පදනම් කර ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්කම් මේ කෙරෙහි බලපා තිබුණි. |

**1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන් 168 දෙනෙකුගේ මාස 03 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු. 3,107,329 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 හා 3 ඡේද ප්‍රකාරව හා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | විශ්‍රාම ලිපි ගොනු සකස් කිරීම, දෙපාර්තමේන්තු බඳවා ගැනීම් පරිපාටි අනුමත කිරීම යනාදී කටයුතු අවසන් වීමෙන් අනතුරුව ස්ථාන මාරු වී ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට හැකි බව හා නිශ්චිත කාලයක් සඳහන් කළ නොහැකි බව.<br>වැඩතහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන් සම්බන්ධ කරුණු විමසා බලා අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.6 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2002 හා 2003 වර්ෂවලදී ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වැඩිපුර අයකරගත් බවට සඳහන් රු. 607,109 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමට ඇතුළත් කර තිබුණි. | ලේඛන පරීක්ෂා කර බලා නිරවුල් කළ යුතු වීම. | තවදුරටත් පරීක්ෂා කර බලා 2019 වසර තුළ හිමිකරුවන් සොයා ගැනීමට නොහැකි වුවහොත් ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ)සමෘද්ධි බැංකු කළමනාකරණය හා මෙහෙයවීම සඳහා ස්ථාපිත කර ඇති ක්ෂුද්‍රමූල්‍ය බැංකු අංශයේ ගනුදෙනු, පොදු තැන්පත් ගිණුම මඟින් සිදුකිරීමට භාණ්ඩාගාරයේ අවසරය ලබා | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගනුදෙනු සඳහා පොදු තැන්පත් ගිණුම භාවිතා කිරීමට කටයුතු නොකළ යුතු වීම. | මූල්‍ය පාලනයේ විනිවිදභාවය හා ද්විගණනය වැළැක්වීම සඳහා බැංකු වෙනුවෙන් දැරීමට සිදුවන්නා වූ සියළුම පුනරාවර්තන හා ප්‍රග්ධන ස්වභාවයේ වියදම් දෙපාර්තමේන්තුවේ ගිණුම් |

| | | |
|---|---|---|
| ගෙන නොතිබුණි. එසේ වුවද, එම අංශයේ ගණුදෙනු සිදු කිරීමෙන් පසු දෙසැම්බර් 31 දිනට ඉතිරි තැන්පතු රු.මිලියන 20.11 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයටද ඇතුළත් කර තිබුණි. | | අංශය මගින් සිදුකරනු ලබයි. |
| (ඇ) පුහුණු මධ්‍යස්ථානවල ඉපැයුම් රු. 5,485,555 ක් හා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ආයෝජන උපලබ්ධි කිරීම් රු. 2,191,162 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 හා 3 වගන්ති අනුව අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 (1) වගන්තිය ප්‍රකාරව නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නොලැබෙන සියලුම ලැබීම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වීම. | අධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව දක්ෂිණ සංවර්ධන මූල්‍ය සමාගමේ සේවකයන්ට වන්දි ගෙවීම සඳහා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ආයෝජන උපලබ්ධි කිරීම් රු. **2,191,162** ක් රදවාගත් බව හා පුහුණු මධ්‍යස්ථාන ඉපැයුම්වලින් රඳවා ගැනීම් පරිපාලන වියදම් ආවරණය කිරීම සඳහා බව. |
| (ඈ)**2015** හා **2016** වර්ෂයන්හි ලබා දී තිබු ප්‍රතිපාදනවලින් ඉතිරිව ආපසු එවා තිබු එකතුව රු. **1,137,117** ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | වර්ෂය අවසන් වන විට තත්‍ය වියදම හදුනාගෙන භාණ්ඩාගාරයට නිවැරදිව අග්‍රිම පියවීම කළ යුතු වීම. | **2019** මැයි මාසයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක් ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | චක්‍රලේඛය හා රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වීම. | වත්කම් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමෙන් පසු ලේඛනවල ඇතුළත් කර වත්කම් ලේඛන යාවත්කාලීන කරනු ලැබේ. |

(ආ)**වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතු වීම. | වාහන විස්තර ඇතුළත්ව පවත්වාගෙන යනු ලබන ලේඛනය මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් කිරීමට කටයුතු කරනු ලබේ. |

(ඇ)**හානි පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය සියළු තොරතුරු ඇතුළත්ව යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය සියළු තොරතුරු ඇතුළත්ව යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. |

## 1.6.8 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)දෙපාර්තමේන්තුව මූලා පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | ඉදිරියේදී අදාළ සමාලෝචන සිදුකර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ |

| | | |
|---|---|---|
| විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ)විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුම් සඳහා කාල පමාවකින් තොරව පිළිතුරු සැපයීමේ අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස් කිරීමට පියවර ගනු ලැබේ. |

## 1.6.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2013 අංක 01 දරන දිවිනැගුම පනත | | | |
| (i) 5 (ඊ) වගන්තිය | දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන, දිවිනැගුම ප්‍රාදේශීය සංවිධාන, දිවිනැගුම දිස්ත්‍රික් කමිටු, දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති විගණනය කිරීමට හැකි වන ආකාරයට පනත සංශෝධනය කර නොතිබුණි. | අදාළ සමිති සහ සංවිධාන විගණකාධිපතිවරයාට විගණනය කිරීමට හැකි වන ලෙස ප්‍රතිපාදන ඇතුළත් කර පනත සංශෝධනය කළ යුතු වීම. | බාහිර විගණන ආයතනයක් තෝරාගෙන විගණන කටයුතු සිදු කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතියි. |

| | | | |
|---|---|---|---|
| (ii) 36 හා 37 වගන්ති | සමෘද්ධි සංවර්ධන අරමුදල හා සමෘද්ධි චක්‍රීය අරමුදල පිහිටුවා නොතිබුණි. | වගන්ති ප්‍රකාරව අදාළ අරමුදල් පිහිටුවීමට කටයුතු කළ යුතු වීම. | සමෘද්ධි සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමුකර ඇත. |
| (ආ)2003 අංක 17 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ 05 වගන්තිය | අනියම් සේවකයන් 21 දෙනෙකු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක කර නොතිබූ අතර, ඔවුන් වෙනුවෙන් 2018 වර්ෂය තුළ එම අරමුදලට ප්‍රේෂණය නොකළ මුදල රු. 468,727 ක් විය. | පනත ප්‍රකාරව අනියම් සේවකයන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක කර ගත යුතු වීම. | මෙම නිලධාරීන් සඳහා පත්වීම් ලිපි නිකුත් කිරීමේදී දායකත්වය පිළිබඳ සඳහන් නොවීමේ දෝෂය හේතුවෙන් ඇති වූ මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 756, 757 හා 1647 (අ) | දෙපාර්තමේන්තුව සතු වාහන 140 සම්බන්ධයෙන් සමීක්ෂණයක් දෙපාර්තමේන්තුව ආරම්භ කළ 2014 වර්ෂයේ සිටම සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාහන වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වීම. | වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ. |
| **(ඇ)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහන 140 න් වාහන 126 ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වීම. | සියලුම වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර බැලීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 28 ක හැර ඉතිරි වාහන සඳහා නම හා රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | සියළු වාහන සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නම හා රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වීම. | දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සඳහා දෙපාර්තමේන්තුවේ නම හා නිල ලාංඡනය යෙදීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| (ඉ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල හා බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල යන අරමුදල් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යන අරමුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදල් බවට පත් කරනු ලැබිය යුතු වීම. | සමෘද්ධි පනතේ 45 වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල් පවත්වාගෙන යාමට බලතල පවතියි. |

**1.6.10 අවිධිමත් ගනුදෙනු**

**(අ) අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට සහාය වීම සඳහා ස්ථාපිත කර ඇති දිවිනැගුම (සමෘද්ධි) ජාතික සභාවට පත්කළ සාමාජිකයින්ට හා එහි ලේකම්වරයාට දීමනා ගෙවීමට රෙගුලාසි සකස් කර නොතිබුණි. එසේ වුවද, එම සභාවේ සාමාජිකයන් 11 දෙනෙකුට 2014 වර්ෂයේ ජුලි මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා සභාවාර 41 කට | විධිමත් අනුමැතියකින් තොරව දීමනා ලබාගත නොහැකි වීම. | රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක අධ්‍යක්ෂක මණ්ඩලයෙන් සිදුවන මෙහෙයට සමාන කාර්යය භාරයක් දිවිනැගුම ජාතික සභාව මගින් සිදු වන බැවින් ප්‍රධාන ගණකාධිකාරීගේ නිර්දේශය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පදනම් කරගෙන ජාතික සභාවේ සාමාජිකයන්ට දීමනා ගෙවනු ලබන බව හා |

| | | |
|---|---|---|
| සහභාගිවීම වෙනුවෙන් එක් සභාවාරයකට රු. 6,000 බැගින් එකතුව රු. 1,787,000 ක් හා සභාවේ ලේකම්වරයාට එක් සභාවාරයකට රු. 5,000 බැගින් 2017 මාර්තු මාසයේ සිට 2018 මාර්තු මාසය දක්වා සභාවාර 13 ක් සඳහා රු. 65,000 ක් වශයෙන් දීමනාවක් ගෙවා තිබුණි. | | සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව කමිටු රැස්වීම් පැවැත්වෙන හෙයින් ජාතික සභාවේ අනුමැතිය මත ජාතික සභාවේ ලේකම්ට දීමනා ගෙවනු ලබයි. |

**(ආ) වංචනික ස්වරූපයේ ගනුදෙනු**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>------------------------ | **නිර්දේශය**<br>------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>--------------------------------- |
|---|---|---|
| **(i)**2014-2018 කාලය තුළ වාර්තා වූ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු. 23,406,847 ක මූල්‍ය වංචාව, ප්‍රජාමූල බැංකු 06 ක රු. 4,136,984 ක සහනාධාර මුදල් වංචා කිරීම් හා සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා සම්බන්ධව අවස්ථා 03 කදී වාර්තා වූ රු. 6,513,220 ක වංචාව වශයෙන් එකතුව රු. 34,057,051 ක් වූ මූල්‍ය වංචාවන්හි පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. වංචාවන් දෙකකින් අයකරගත් මුදල රු. 1,520,000 ක් හෙවත් සියයට 4.5 ක් පමණක් විය. | විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර සියළුම මූල්‍ය වංචාවන්හි පරීක්ෂණ කටයුතු හැකි ඉක්මනින් අවසන් කර රජයට සිදුකර ඇති පාඩු අයකර ගත යුතු බව හා වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම. | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුව ඇති වංචාවෙන් දැනට රු. 2,500,000ක් අයකරගෙන අධිකරණයේ නඩු පවරා ඇති බව හා විනය පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව. සහනාධාර මුදල් වංචා හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා සම්බන්ධ වංචාවන් ගෙන් රු. 6,923,300ක් අයකර ගෙන ඇති බව හා පරීක්ෂණ කටයුතු විවිධ අවස්ථාවන්හි පසු වේ. |

| | | |
|---|---|---|
| **(ii)**වක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව බැංකු කලාප 6 ක සමෘද්ධි සහනාධාර හා ජීවනෝපාය ප්‍රතිලාභ ලබා දීම, ප්‍රතිලාභීන්ට බලපෑම් කරමින් 2017 ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධි කොඩි දිනය සඳහා මුදල් රැස්කර ගැනීම, සමාජ ආරක්ෂණ භාර අරමුදලේ ප්‍රතිලාභ වැරදි ආකාරයට ලබා දීම, සමෘද්ධි බැංකු 2 ක් ගිනි තැබීම, ප්‍රතිලාභීන්ට ණය ලබාදීමේ ස්වරූපයේ ව්‍යාජ ලේඛන සකස්කර සමෘද්ධි බැංකුවකින් රු. 3,082,999 ක් වංචා කිරීම වශයෙන් අනාවරණය කරගත් අක්‍රමිකතා 12 ක හා 2002 වර්ෂයේ සිට 2018 වර්ෂය අතර කාලය තුළ නිලධාරීන් විසින් සිදුකර ඇති බවට අනාවරණය කරගත් විනය කඩකිරීම් හා අපරාධ සම්බන්ධ වැරදි 107 ක පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර සියළුම මූල්‍ය වංචාවන්, විනය කඩකිරීම් හා අපරාධ වැරදි සම්භන්ධයෙන් පරීක්ෂණ කටයුතු හැකි ඉක්මනින් අවසන් කර රජයට සිදුකර ඇති පාඩු අයකර ගත යුතු බව හා වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම. විගණන විමසුම් හා විගණන වාර්තාවල ඇතුළත් කරුණු නිසි පරිදි අධ්‍යයනය කර ඒ සඳහා නිවැරදි පිළිතුරු ලබාදිය යුතු වීම. | පිළිතුර ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)අධි ප්‍රතිපාදන සලසා තිබීම. | | |
| **(i)**පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරුකරගත් රු. 1,287,500 ක ප්‍රතිපාදනයෙන් රු. 356,702 ක් හෙවත් සියයට 27.7 ක් හා තවත් පුනරාවර්තන | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වැය විෂයයන් අතර වියදම් මාරු වී වාර්තා වී තිබීම මේ සඳහා හේතු වී තිබුණි. |

| | | |
|---|---|---|
| වැය විෂයයක ඉතිරිවීම් තිබියදී මාරු කරගත් රු. 180,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | | |
| (ii)ප්‍රාග්ධන හා පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා සලසා තිබුණු රු. 530,000 ක සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | මෙවැනි දෝෂ වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii)කාර්යමණ්ඩල පුහුණු කිරීම් සඳහා වෙන්කර ගෙන තිබූ රු. මිලියන 9 ට අමතරව, සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමට වෙන්කළ ප්‍රතිපාදනයෙන් ද රු. මිලියන 55 ක් වෙන් කරවා ගෙන තිබුණ ද වැයකර තිබුණේ රු. මිලියන 26.29 ක් පමණි. | අමතර ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතු වීම. | පුහුණු වැඩසටහන් සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මීට හේතු වී තිබුණි. |
| (ආ)සලසා තිබූ ප්‍රතිපාදනය නිෂ්ඵල වීම.<br>------------------------------------ | | |
| ප්‍රාග්ධන වැය විෂයයන් 08 ක රු. මිලියන 2,026.90 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය රු. මිලියන 1,086.87 ක් හෙවත් සියයට 53.6 ක් වූ අතර, එම වැය විෂයයන්ගේ ඉතිරිය සියයට 13 ක සිට සියයට 80 ක් අතර පරාසයක ප්‍රමාණයක් විය. තවද, පුනරාවර්තන වැය විෂයයන් 09 ක රු. මිලියන 1162.10 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 629.56 ක ඉතිරියක් ද නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වැටුප් පරිවර්තන විධිමත් හා සමාන්‍ය ක්‍රමවේදයට සිදු නොවීම, වැය විෂයයන් 02 ක් මාරු කිරීම, අනියම් සේවකයන් ස්ථිර කිරීම, භාණ්ඩාගාර අග්‍රිම නොලැබීම, වැය විෂයයන් අතර වියදම් වාර්තා කිරීමේ දෝෂ, පූර්ව සැලැසුම්<br><br>විධිමත් අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක නොවීම යනාදිය ප්‍රතිපාදන ඉතිරියට හේතු වී තිබුණි. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 284.06 ක ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 48.29 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම්වලට එළඹිය යුතු වීම. | වියදම් දැරීමේ වගකීමට බැදෙන පාර්ශවයන් විසින් නිවැරදි පුරෝකතනයන් නොකිරීම මේ සඳහා හේතු වී ඇත. |
| (ආ)පාරිතෝෂික ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් ගණනය කළ සියයට 30 ක අධිභාරයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් ගෙවිය යුතු රු. මිලියන 843.16 ක් ඇතුළත්ව, වන්දි හා පාරිතෝෂික බැරකම රු. මිලියන 3,057.26 ක් වුවද එය රු. මිලියන 26.81 ක් අඩුවෙන් බැරකම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | අනුමත සීමාව තුළ බැරකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගැළපිය යුතු වීම. | 2016 හා 2017 වර්ෂයන්හි ලද මුළු ප්‍රතිපාදනය වියදම සේ සළකා බැරකම් වාර්තාව පිළියෙල කිරීම හේතුවෙන් බැරකම අඩුවෙන් දක්වා ඇත. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)තත්කාර්යය අතුරු අග්‍රිමය කාර්ය නිම වී දින 10 ක් ඇතුළත පියවිය යුතුව වුවද, නිලධාරීන් 21 දෙනෙකුට අවස්ථා 57 කදී ලබාදුන් රු. 4,304,994 ක තත්කාර්යය අතුරු අග්‍රිමය දින 10 ක සිට | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්ය නිම වී දින 10 ක් ඇතුළත තත්කාර්යය අතුරු අග්‍රිමය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | වවුචර් සකස් කිරීමේ අඩුපාඩු, මූල්‍ය සීමාවන් පිළිබඳ නිලධාරීන්ගේ අනවබෝධය, මූල්‍ය පාලන බලතල පැවරීමේ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතු වී තිබුණි. වර්තමානයේදී අත්තිකාරම් |

| | | |
|---|---|---|
| මාස 03 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. | | පියවීම සම්බන්ධ විධිවිධාන දැඩිව පිළිපැදීම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ)නිසි පූරෝකථනයන් නොකර තත්කාර්යය අතුරු අග්‍රිම ලබාදීම නිසා නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 14 කදී ලබාදී තිබූ එකතුව රු. 1,066,540 ක අත්තිකාරම් මුදලින් රු. 540,269 ක් ඉතිරි වී ආපසු මුදලින් පියවා තිබුණි. එම ඉතිරිවීම් ලබා දී තිබූ අතුරු අග්‍රිමයෙන් සියයට 29 ක සිට සියයට 69 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | විධිමත් ඇස්තමේන්තුවක් පදනම් කරගෙන තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වීම. | අධි ඇස්තමේන්තු කිරීම් වළක්වා ගැනීමේ අභ්‍යන්තර ක්‍රමවේද සකස් කර ගැනීමට පියවර ගෙන ඇත. |

**2.4** **බැංකු ගිණුම් මෙහෙයවීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------------------- |
| (අ)2016 වර්ෂයේ ගිණුම් තැබීමේ දෝෂයක් බවට දෙපාර්තමේන්තුව හඳුනාගත් එකතුව රු. 2,950,975 ක් වූ ශේෂ දෙකක් නිරවුල් කර ගැනීමට කටයුතු නොකර උපලබ්දි නොවූ තැන්පත් වශයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් කර තිබුණි. | ගිණුම් තැබීමේ දෝෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කළ යුතු වීම. | 2016 මාර්තු මස හිඟ සහනාධාර මුදල් සෘජුව ප්‍රේෂණය කිරීම මුදල් පොතේ සටහන් නොකිරීම හේතුවෙන් උපලබ්ධි නොවූ තැන්පත් වශයෙන් බැංකු සැසඳුමට ඇතුළත් වී ඇති අතර එය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ)ප්‍රධාන කාර්යාල නිල බැංකු ගිණුමට අවස්ථා 16 කදී සෘජුව බැර වී ඇති රු. 1,487,472 ක් මුදල් පොතට ගැලපීමට කටයුතු නොකර බැංකු සැසඳුමට ඇතුළත් කර තිබුණි. | බැංකුවේ සෘජු බැර එම මාසයේම මුදල් පොතට ගළපා නිවැරදිව අග්‍රිම පියවීම කළ යුතු වීම. | සෘජු බැර හඳුනාගෙන නිල ගිණුමට ගැළපීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 දැක්ම හා මෙහෙවර**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 1995 වර්ෂයේදි ආරම්භ කර තිබූ සමෘද්ධි සහනාධාර වැඩසටහන මඟින් දිළිඳුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක හඳුනාගෙන නොතිබුණි. තවද, සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන පිහිටුවා තිබූ 1,074 ක් වූ ප්‍රජාමූල බැංකු පද්ධතිය එම අරමුණෙන් බැහැරව ලාභ ඉපැයීම අරමුණු කර ගෙන තිබුණි. එසේ වුවද, 2013-2018 වර්ෂ 06 ක කාලය තුළ රජයේ සමෘද්ධි සහනාධාර වියදම රු. මිලියන 190,193.53 ක් ද සමෘද්ධි සංවර්ධන වියදම රු. මිලියන 6,752.10 ක් ද විය. | දිළිඳුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක හඳුනාගෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඉලක්කගතව වැඩසටහන් මෙහෙය වීමට කටයුතු කළ යුතු වීම. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා සමෘද්ධි බැංකු පද්ධතිය ආරම්භ කර තැන්පත් වර්ධන වැඩසටහන් හා ණය වැඩසටහන් හඳුන්වා දී ඇත. |

## 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්මට රු. මිලියන 2000 කින් ඉටු කිරීමට අපේක්ෂිත ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් පමණක් ඇතුළත් කර තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ද ඇතුළත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | 2019 සංවර්ධන සැලැස්ම සඳහා අදාළ වාර්තාවන් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිය හා කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් සහය වීම සඳහා සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත දිවිනැගුම (සමෘද්ධි) ජාතික සභාව පිහිටුවා සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර 06 ක් පවත්වා තිබුණි. එසේ වුවද, සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම සඳහා නිශ්චිත නිර්ණායක හඳුන්වා ප්‍රතිපත්ති ස්ථාපිත කර නොතිබූ අතර ගන්නා ලද බොහෝ තීරණ ක්‍රියාත්මක වී නොතිබුණි. | 2013 අංක 1 දරන දිවිනැගුම (සමෘද්ධි) පනතේ 7 වගන්තිය ප්‍රකාරව දිවිනැගුම (සමෘද්ධි) ජාතික සභාව, දිවිනැගුම (සමෘද්ධි) වැඩසටහන්වල ප්‍රතිපත්තිය හා කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට සහය වීම නිසි පරිදි ඉටුකළ යුතු වීම. | නිශ්චිතව අදහස් දක්වා නැත. 2016-2017 වර්ෂවලදී නිර්ණායකයන් 06 ක් ඔස්සේ සහනාධාර ලැබිය යුතු පවුල් හඳුනාගැනීම සඳහා සිදුකළ සමීක්ෂණයෙන් පවුල් 450,959 ක් සවිබල ගැන්වී ඇති බවට හඳුනාගත් නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ඉදිරි කටයුතු නතර කරන ලද බව හා 2002 අංක 24 දරන සමාජ සුභසාධන පනත මඟින් පිහිටුවන ලද සමාජ සුභසාධන මණ්ඩලය විසින් සවිබල ගැන්වූ පවුල් හඳුනා ගැනීම සඳහා හඳුන්වා දී ඇති පොදු |

| | | |
|---|---|---|
| | | නිර්ණායකයන් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂිතයි. |
| (ආ)සමාලෝචිත වර්ෂයේදී සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කළ රු. මිලියන 2,000 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 927.81 ක් හෙවත් සියයට 46.4 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදිත මුදල් නිසි පිරිදි උපයෝජනය කළ යුතු වීම. | |
| **(i)**රේඛීය අමාත්‍යාංශයට ලබාදුන් රු. මිලියන 400 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය නොකළ ප්‍රමාණය රු. මිලියන 334.70 ක් හෙවත් සියයට 83.7 ක් විය. | සැලැසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. | අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව අනුව උපයෝජනය රු. මිලියන 94.46 ක් වන බව. |
| **(ii)**සැලැසුම් කරන ලද ක්‍රියාකාරකම් 68 කින් ක්‍රියාකාරකම් 17 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු. මිලියන 136.8 ක් විය. තවද, ක්‍රියාකාරකම් 38 ක් යටතේ ව්‍යාපෘති 2,057,161 ක් ඉටුකිරීම සඳහා සලසාගත් රු. මිලියන 1,229.42 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 562.14 කට අදාළ ව්‍යාපෘති 1,911,250 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර, එලෙස ඉතිරි වූ ප්‍රතිපාදනය සියයට 45.7 ක් විය. | සැලසුම් කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. | භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, මිලදී ගැනීම් හා ජීවනෝපාය වැඩසටහන් ආරම්භ කිරීම ප්‍රමාද වීම, විටින් විට අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙනස්වීම මේ කෙරෙහි බලපා තිබුණි. |
| **(iii)**යටිතල පහසුකම් සංවර්ධනය යටතේ දිවයින පුරා සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් හඳුනා නොගෙන දිස්ත්‍රික්ක 04 ක මාර්ග 04 ක් හා අංකෙලිපිටිය ජලයෝජනා ක්‍රමය පුළුල් කිරීම සඳහා වෙන්කළ රු. මිලියන 43.07 කින් රු. මිලියන 4.44 ක් වැයකර දිස්ත්‍රික්ක 03 ක මාර්ග 03 ක් සංවර්ධනය කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රතිපාදන ලබා දුන් අරමුණුගත කාර්යයට වියදම් කළ යුතු වීම. | 2018 වර්ෂයේ මුල් ක්‍රියාකාරී සැලැස්ම මඟින් සියළු දිස්ත්‍රික්ක සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. |
| **(iv)**සමාජ සුභසාධන අංශය සඳහා | සැලසුම් කළ කාර්යයන් ඉටු | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ |

| | | |
|---|---|---|
| වෙන්කළ රු. මිලියන 10 කින් එම කාර්යයන් ඉටු නොකර දිස්ත්‍රික්ක 02 ක නව සමෘද්ධි සහනාධාර ලබාදීමේ උත්සව කටයුතු හා නිරීක්ෂණ චාරිකා සඳහා රු. මිලියන 15.69 ක් වැයකර තිබුණි. | කිරීමට කටයුතු කළ යුතු වීම. | නව සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා හිමිකම්පත් නිකුත් කිරීමේ ප්‍රධානෝත්සවයේ උත්සව කටයුතු සංවිධානය කරන ලෙස ලැබුණු උපදෙස් මත කටයුතු කරන ලද බව හා ක්‍රියාකාරි සැලැසුම් සංශෝධනය කර ගැනීමේ ප්‍රමාදයක් ඇති වී තිබුණි. |
| (ඇ)තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2011 හා 2012 වර්ෂවලදී රු. මිලියන 33.9 ක වියදමකින් මොඩියුල 3 ක් සහිතව ඉ - සමෘද්ධිය ව්‍යාපෘතිය ස්ථාපිත කර තිබුණි. ඉන් මානව සම්පත් කළමනාකරණ මොඩියුලය (HRM) හා ප්‍රතිලාභි කළමනාකරණ මොඩියුලය (CRM) නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමත් ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති තොරතුරු ඇතුළත් කිරීම සඳහා ස්ථාපිත කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති කළමනාකරණ මොඩියුලය (PPM) අක්‍රියව පැවතීමත් හේතුවෙන් අපේක්ෂිත අරමුණු නිසිපරිදි ඉටු වී නොතිබූ අතර, මෙම මොඩියුලර් වැඩිදියුණු කිරීම සඳහා 2015-2018 කාලය තුළ ක්‍රියාකාරි සැලැසුම් මඟින් වෙන්කළ රු. මිලියන 21 ක් නිසි පරිදි උපයෝජනය කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහල මට්ටමකට ගෙන ඒම සඳහා තොරතුරු තාක්ෂණ වැඩසටහන් වැඩිදියුණු කර කාර්යයන් කාර්යක්ෂම කර ගත යුතු වීම. | මෙම මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා 2015 – 2018 වර්ෂවලදී ක්‍රියාකාරි සැලසුම් මඟින් මුදල් වෙන් කළද ඇමතිවරු හා අධ්‍යක්ෂ ජනරාල්වරු නිතර මාරු වීම මත අනුමැතිය ලබා ගැනීමට ගැටළු ඇති වීමෙන් කළමනාකරණ තීරණ නොගන්නා ලදි. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව හා ප්‍රගති වාර්තා සමඟ සැසඳීමේදී | නිවැරදි දත්ත පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව හා ප්‍රගති වාර්තාව සකස් කළ යුතු | දළ වාර්තා පදනම් කරගෙන කාර්යසාධන වාර්තාව සකස් කළ බව හා මාර්තු මස අවසානයේ ඉදිරිපත් වූ තථ්‍ය |

| | | |
|---|---|---|
| ක්‍රියාකාරකම් 08 ක මූල්‍ය ප්‍රගතියේ රු. මිලියන 126.58 ක වෙනසක් නිරීක්ෂණය විය. | වීම. | වියදම් වාර්තා පදනම කරගෙන ප්‍රගති වාර්තාව සකස් කරන ලදී. |

**3.5 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ)(ඇ)(ඈ)(ඉ) හා 4.2.2 මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැසුම් හා ප්‍රසම්පාදන කාලසටහන් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කාලසටහනක් පිළියෙල කර නැත. |
| (ආ)සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 5,000 කට විධිමත් පත්වීම් ලිපි ලබාදීමේ උත්සව කටයුතු සංවිධානයට අදාළව ප්‍රසම්පාදන කාර්යයන් 05 ක් රු.මිලියන 5.4 ක් වැයකර ක්‍රියාත්මක කිරීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1, 6.2.2, 6.3.1(ඇ), 4.2, 6.3.3 හා 7.11.1 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම. | පැවති තත්ත්වය අනුව කටයුතු කිරීමට සිදුවිය. |

**3.6 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ඒකාබද්ධ වූ ආයතන 04 කට අයත්ව තිබූ ඉඩම් හා ගොඩනැඟිලි දේපල 27 ක් හා වාහන 02 ක් දෙපාර්තමේන්තුවට | 2013 අංක 01 දරන දිවිනැගුම (සමෘද්ධි) පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ වූ අධිකාරිවල සියළුම වංචල හා නිශ්චල | එම දේපල පවරා ගැනීම හා අත්පත් කර ගැනීමේ කටයුතු විවිධ අවස්ථාවල ක්‍රියාත්මක වේ. |

| | | |
|---|---|---|
| පවරාගෙන නොතිබූ අතර, ඉන් ගොඩනැගිලි 23 ක වටිනාකම රු. 118,987,414 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | දේපල අප්‍රමාදව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | |
| (ආ)ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් වසර 30 ක කාලයකට බදු දී ඇති ඉඩම් හා ගොඩනැගිලි දේපල 6 ක බදු ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, පැරණි ගිවිසුම් මත සමාලෝචිත වර්ෂයේ ඉපැයූ ආදායම රු. 2,977,836 ක් විය. | දෙපාර්තමේන්තුව විසින් අළුත් බදු ගිවිසුම් සඳහා එකඟවීමක් ඇති කර ගත යුතු වීම. | බදු දී ඇති දේපළ 6 ක් සම්බන්ධයෙන් අදහස් දක්වා නැති අතර නිරීක්ෂණයේ සඳහන් නොවූ අබලන් වූ ගොඩනැගිලි සහිත තාවකාලිකව පවරා ගෙන ඇති දේපල 2 ක් ආපසු භාරදීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි. |

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ආඥාපනතට අනුකූලව ඇප තැන්පතු ලබා ගත යුතු වීම. | කමිටුවක් පත් කර ඇති බව හා ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන චක්‍රලේඛ නිකුත් කිරීමට නියමිත කටයුතු කරනු ලබයි. |

**3.8 පාඩු හා හානි**

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2011 වර්ෂයේදී අනතුරටපත් ලොරි රථයට සිදු වී තිබූ රු. 668,325 ක අලාභය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත් අලාභය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ)2016 වර්ෂයේදී රාජකාරි | වාහන අළුත්වැඩියා කිරීම | සොයාබලා කඩිනම් ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| නොවන ගමන්වලදී අනතුරට පත් වාහන 2 කින් එක් වාහනයකට රක්ෂණ වන්දි වශයෙන් ලැබුණු රු. 2,000,000 ක මුදල 2018 දෙසැම්බර් 08 දින පෞද්ගලික ගරාජයක් වෙත ගෙවා තිබුණි.එසේ වුවද වාහනයේ අළුත්වැඩියා කටයුතු විගණිත දින දක්වාම සිදුකර නොතිබුණි. රක්ෂණ වන්දි ලබා දී නොතිබූ අනෙක් වාහනය අළුත්වැඩියා කිරීමකින් තොරව වසර 03 ක් තිස්සේ පෞද්ගලික ගරාජයක රඳවා තිබුණි. | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ඇ)මාතලේ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට අනුයුක්ත වාහනයක් රියදුරුගේ වරදින් අනතුරටපත් වීම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කර රු. 279,937 ක අලාභය අයකර ගැනීමටත් එය හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අලාභය ලේඛනගත කර අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත. |
| (ඈ)දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි දෙක සතු වාහන 12 ක් පවරා ගැනීමේදී අර්ධ සුබෝපභෝගී ද්විත්ව කාර්ය බදු මුදල් රු. 527,500 ක් නොගෙවීම මත සමාලෝචිත වර්ෂයේදී රු. 263,750 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | රාජකාරි කටයුතු ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි 156 (1) (අ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාහන පවරා ගැනීමේදී ඒකාබද්ධ වූ අධිකාරී මඟින් නොගෙවූ බදු මුදල් ගෙවීමට සිදු විය. |

**3.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 05 කට හා පෙර වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට පිළිතුරු | සියළුම විගණන විමසුම්වලට නියමිත කාලය තුළ පිළිතුරු සපයා අදාළ නිවැරදි කිරීමක් කළ යුතු | විගණන විමසුම් සඳහා කාල ප්‍රමාදයකින් තොරව පිළිතුරු සැපයීමේ අභ්‍යන්තර වැඩ පිළිවෙලක් සකස් කිරීමට |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රමාදය මාස 02 ක සිට වසර 01 මාස 03 ක් දක්වා කාල පරාසයක් වී තිබුණි. එම විමසුම්වල ඇති ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 74.01 ක් විය. | වීම. | කටයුතු කරමි. |

**3.10 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)2015-2017 කාලය තුළ රු. 107,535,031 ක වියදමක් දරමින් සිදුකළ සහනාධාරලාභීන් නැවත හඳුනා ගැනීමේ සමීක්ෂණ කර තිබුණි. එසේ වුවද, එම තොරතුරු සැලකිල්ලට නොගෙන මාතලේ හා පොලොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි තෝරාගත් පවුල් 9250 ක් සඳහා 2018 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් මාසය දක්වා රු. 75,333,000 ක් වැය කරමින් සහනාධාර ලබා දී තිබුණි. | නියමිත ක්‍රමවේදයන් අනුව සමෘද්ධිලාභීන් තෝරාගෙන ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතු වීම. | පුවත්පත් දැන්වීම් පල කිරීම මඟින් ප්‍රතිලාභීන් තෝරා ගෙන තිබුණි. |
| (ආ)2003 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දක්වා නිලධාරීන් විසින් සිදුකර තිබූ සමෘද්ධි බැංකු හා බැංකු සමිති 165 ක මුදල් වංචා කිරීම් 123,802,063 ක්, සමෘද්ධි සංවර්ධන භාර අරමුදලේ මුදල් වංචා කිරීම් රු. 5,200,500 ක් සහ දුම්වැටි හා මත්විරෝධී දින කොඩි වැඩසටහනේ මුදල් වංචා කිරීම් රු. 174,850 ක් වශයෙන් එකතුව රු. 142,677,413 ක් වංචාකිරීම් සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් වී නොතිබුණි. එසේ තිබිය දී වංචාවන් 16 කින් සමාලෝචිත වර්ෂයේදී අයකරගත් බවට වාර්තා කළ | වැරදි හා වංචා අවම කර ගතහැකි ආකාරයට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් විධිමත් කළ යුතු බව හා පරීක්ෂණ කටයුතු කඩිනම් කර අලාභයන් අයකර ගැනීමටත් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතු වීම. | අලාභ අයකර ගනිමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත. |

වටිනාකම රු. 12,880,092 ක් විය.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2030 වර්ෂය වන විට දුගීබවින් තොර සමෘද්ධිමත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශකවලට අනුකූලව දෙපාර්තමේන්තුව විසින් සිය අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඒ අනුව ප්‍රතිපාදන වෙන්කර ගෙන ආයතනය සතු මානව හා භෞතික සම්පත් යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන වෙන්කර ගෙන, ක්‍රියාකාරී සැලැසුම් සකස් කර දුගීබවින් තොර සමෘද්ධිමත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019-2021 දක්වා කාල පරිච්ඡේදය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද බව හා දිළිඳුකම තුරන් කිරීමේ අරමුණෙන් යුතුව 2017 හා 2018 වර්ෂවල වැඩසටහන් සැලසුම් කර ඇත. |

## 5. යහපාලනය

### 5. 1 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටුව මඟින් විගණකාධිපති වාර්තා නිසි පරිදි සමාලෝචනය කර ඌනතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිවැරදි පියවර ගෙන නැති හෙයින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු | පනතේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු කළ යුතු වීම. | විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති සාකච්ඡා නොකළ කරුණු 2019 වර්ෂයේ කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට කටයුතු කරමි. |

වී නොතිබුණි.

**6. මානව සම්පත් කළමනාකරණය**

2018 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 27,189 ක් හා 25,506 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 12,206.20 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)දෙපාර්තමේන්තුවේ සේවාවන් තුනකට හැරුණු විට අධිකාරී තුනෙන් අනුයුක්ත වූ අනුමත කාර්ය මණ්ඩලය 1,049 ක් සඳහා සේවා ව්‍යවස්ථාවක් හා තනතුරුවලට අදාළව බඳවාගැනීමේ පටිපාටි අනුමත කරගෙන නොතිබුණි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු වීම. | කාර්ය මණ්ඩලය අනුමත කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර නොතිබීම මීට හේතු වී ඇත. |
| (ආ)2014 ජනවාරි 03 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 04 ක කාල පරිච්ඡේදය තුළදී ගණන්දීමේ නිලධාරී වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරු 10 දෙනෙකු කෙටිකාලීනව පත්කර තිබීම දෙපාර්තමේන්තු කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි. | අධ්‍යක්ෂක ජනරාල්වරුන්ගේ සෘජු අධීක්ෂණයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවාගත යුතු වීම. | 2015 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශ හා විෂය භාර අමාත්‍යවරුන් වෙනස්වීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වෙනස් වීම් සිදුවීමට හේතු විය. |